**ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 20 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

## 2.1 විසර්ජන ගිණුම

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,631.62 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,543.23 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 88.39 ක් හෙවත් සියයට 5.42 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 973.62 | 956.15 | 17.47 | 1.79 |
| මූලධන | 658.00 | 587.08 | 70.92 | 10.78 |
| **එකතුව** | **1,631.62** | **1,543.23** | **88.39** | **5.42** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 20.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 22.45 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 12.25 ක වැඩියෙන් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2015 දෙසැම්බර් 31දිනට** | | | **ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20-03-02-06 | 20.00 | 22.45 | 2.45 | 12.25 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 45.3 | 38.7 | 33.3 | 37.7 | 150.0 | 133.1 |

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දින ශේෂය රුපියල් මිලියන 341 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ආ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඈ) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (අ) මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |
| (ඉ) | අලිවෙඩි තොග ලේඛනය | 2003 ඔක්තෝබර් 16 දිනැති අංක 15/2003 දරන දෙපාර්තමේන්තු ගිණුම් චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඊ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 පොදු තැන්පත් ගිණුම**

----------------------

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.770,630 ක් වූ තැන්පතු 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 ආදායම් ගිණුම්**

-----------------

1958 අංක 29 දරන සත්ව පනත හා 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව සතුන් ප්‍රවාහනය කිරීමේදී අයකරනු ලබන මුදල මෙම දෙපාර්තමේන්තුවට අයත් ආදායම් සංකේතයට අයත් ආදායමක් නොවන බැවින් එම මුදල දෙපාර්තමේන්තුවේ ආදායමින් ඉවත් කිරීමට කටයුතු නොකර රු.632,510 ක් වූ ආදායම තවදුරටත් දෙපාර්තමේන්තුවේ ආදායම් වශයෙන් ආදායම් ගිණුමේ දක්වා තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------------

විෂය අංක 28401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,594,584 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 2 ක සිට වර්ෂ 23 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

------------------------------------------

**3.5.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

-------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

--------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) මෝටර් රථ වාහන 14 ක් වසර 3 කට වැඩි කාලයක් මුළුල්ලේ නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. තවද පළාත් කාර්යාලවලට අනුයුක්ත කර තිබූ වාහන 07 ක් අළුත්වැඩියා කිරීම සඳහා කටයුතු නොකිරීම නිසා මාස 08 ක සිට වර්ෂ 02 දක්වා

කාලපරාසයක සිට ඌන උපයෝජිතව පැවතුණි. මෙම වත්කම් සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) විදුලි වැට ඉදිකිරීමේ රු.5,714,780 ක් වටිනා උපකරණ හා දැව කණු මීගලෑව අඩවි කාර්යාලයේ ද, එවැනිම රු.1,024,000 ක් වටිනා දැව කණු නිකවැරටිය වාපිකාරාමය පන්සල් භූමියේදී අනාරක්ෂිතව අතිරික්ත තොග ලෙස පවතින බව නිරීක්ෂණය විය.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**-----------------------------------------------------------**

වෙනත් ආයතනවලට අයත් වාහන 07 ක් විධිමත් පරිදි පවරා නොගෙන දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිත කර තිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**-----------------------------------------------------------**

ජයන්තිපුර බත්තරමුල්ල නව ප්‍රධාන කාර්යාලයේ ඉදිකර තිබුණු ගොඩනැගිල්ලේ නීත්‍යානුකූල අයිතිය විගණිත දින වූ 2016 අප්‍රේල් 30 දිනවන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-------------------------------------------**

ලැබී තිබුණු පරිත්‍යාගවලින් වියදම් කර ඉතිරි රු.507,850 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 170(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**------------------------------------------------------**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

**-------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති 25 ක් සඳහා රු.46,185,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපාති ආරම්භ කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**----------------------------------------**

දකුණු වනජීවී කළාපයට අයත් තණමල්විල අඩවියේ කොහොලන්කල කරඹවැව විදුලි වැට ඉදිකිරීම සඳහා රු.2,268,000 ක සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැයට අදාළව ප්‍රතිපාදන සලසා තිබුණද, එම ව්‍යාපෘතිය අතහැර තිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) උප ව්‍යාපෘති 14 ක් සඳහා රු.23,696,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ව්‍යාපෘති වලින් කිසිදු භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි.

(ii) හොරොව්පතාන විදුලි වැට ඉදි කිරීමේ කටයුතු 2012 ඔක්තෝබර් 30 දින නිම කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට උක්ත ඉදි කිරීම් නිමකර නොතිබූ අතර කාල ප්‍රමාද ගාස්තු ලෙස රු.17,468,961 ක් අයකරගෙන නොතිබුණි.

## 3.9 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වන සතුන් හා වෘක්ෂලතා ආරක්ෂා කිරිම**

---

වන සතුන් හා වෘක්ෂලතා ආරක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යක් වී තිබුණි. හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ විදුලි වැට ඉදිකිරීම මඟින් ජව සම්පන්න අලි ඇතුන් කුඩා ඉඩ ප්‍රමාණයක ගාල් කර පිටතින් ආහාර සැපයීම මඟින් වටිනා ශක්තිමත් ජාන සහිත අලි ප්‍රවේණින් බිහිවීම වැලකීමට කටයුතු කර තිබුණි. මේ තුළින් අලි ඇතුන් හිංසනයට පත් වී තිබුණු අතර කණුවල දෙපස උල් යෙදීම නිසා සහ කණු යා කිරීමට යකඩ කම්බි පොට 03 ක් යෙදීම නිසා අලින් තුවාල වීම, මිය යාම සිදුවිය හැකි බවද නිරීක්ෂණය විය.

**(ආ) සැලැසුම් කිරීම**

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු නොකළ අවස්ථා කිහිපයක් පහත සඳහන් වේ.

(i) ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් නොවූ ව්‍යාපෘති 38 ක් සඳහා රු. මිලියන 151.49 ක් වූ ප්‍රතිපාදන සලසා ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණත්, එම ව්‍යාපෘති පිළිබඳව දෙපාර්තමේන්තුව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබූ කාර්ය වෙනුවට රු. මිලියන 21.07 ක් වූ වෙනත් කාර්යන් ඉටු කර තිබූ අවස්ථා 02 ක් නිරීක්ෂණය විය.

(iii) මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාකාරකම් 04 ක් සඳහා රු. මිලියන 10.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් රු. මිලියන 8.26 ක් වැය කර එක් ක්‍රියාකාරකමක් වූ නවක වනජීවී නියාමක නිලධාරීන් 148 දෙනෙකු පුහුණු කිරීම පමණක් සිදු කර තිබුණි.

(iv) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර නොතිබුණද, දිනපොත් හා කැලැන්ඩර් මුද්‍රණය සඳහා රු. මිලියන 1.83 ක් ද, අළුතින් මිලදී ගත් ඩබල් කැබ් සඳහා Canopy සවි

කිරීම හා පිටුපස ආවරණ සෑදීම සඳහා රු. මිලියන 9.83 ක් ද සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

### 3.10 අවිධිමත් ගනුදෙනු

ජාතික උද්‍යානවල ලැන්ටානා ගලවා ඉවත් කිරීම සඳහා රු. මිලියන 9.64 ක් පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබුණි. ලැන්ටානා ගලවා ඉවත් කිරීම්වලට අදාළ සිතියම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සිතියම් සමඟ සැසඳීමේදී අපැහැදිලි බවින් යුක්ත වී තිබුණි. නිවැරදි සිතියම් ඉදිරිපත් කළ බවට තහවුරුවක් ලබා නොගෙන ගෙවීම් සිදු කර තිබුණි. එසේම ලැන්ටානා ඉවත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හෝ ඉංජිනේරුවරයාගේ පූර්ණ අධීක්ෂණයක් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

### 3.11 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

හොරොව්පතාන අලි රඳවුම් මධ්‍යස්ථානයේ ආරක්ෂිත වැට ඉදි කිරීමේදී රු. මිලියන 11.02 ක අමු ද්‍රව්‍ය සඳහා වැඩිපුර ගෙවා තිබුණි.

### 3.12 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අය කර ගැනීමේ හැකියාවක් නොතිබුණු හානි සම්බන්ධයෙන්, මුදල් රෙගුලාසි 108 අනුව බලයලත් නිලධාරියෙකු මගින් අත්හැර දැමීමේ නියෝගයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා අවස්ථා 94 ක දී රු. මිලියන 15.98 ක් වූ හානි වසර 10 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි.

(ආ) වනජීවී සංරක්ෂණ නිලධාරීන් විසින් අලි රඳවුම් මධ්‍යස්ථාන ඉදිකිරීමේදී කි.මී.16 ක ඝණ කැලය හා මධ්‍යම ප්‍රමාණයක කැලෑ කපා ඉවත්කර අලිවැට ඉදි කිරීම සඳහා රු.මිලියන 72.82 ක් රාජ්‍ය සංස්ථාවට වැඩිපුර ගෙවා තිබුණි.

### 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1-6 (ඊ) ඡේදයේ සඳහන් කර තිබුණු උඩවලව ජාතික වනෝද්‍යානයට හීලෑ ගවයින් ඇතුළු කිරීම වැලැක්වීමේ අරමුණින් වනෝද්‍යානයේ දකුණු මායිමේ පිහිටි විදුලි වැටට සමාන්තරව කි.මී.17 ක ද්විත්ව විදුලි වැටක් රුපියල් මිලියන 5.68 ක් වැයකර ඉදි කර තිබුණි. එසේ වුවත්, වනෝද්‍යානයට පිටස්තර ගවයින් ඇතුළුවීම වලක්වා නොතිබීම නිසා පූර්වෝක්ත අරමුණු ඉටු වී නොතිබුණි.

## 3.14 කළමනාකරණ දූර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී භාවිතයට ගත් හා නොගත් සංචාරක නිවාස සංඛ්‍යාව හා වෙන් කිරීම් සිදු කළ දින ගණන් හා සංචාරකයන් පැමිණි සංඛ්‍යාව පිළිබඳ පහසුවෙන් හඳුනා ගැනීමට පහසු ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම නිසා සංචාරක නිවාසවලින් ලැබෙන ආදායමේ නිවැරදිතාවය තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පවත්වන ලද දේශන හෝ සම්මන්ත්‍රණ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රාදේශීය කාර්යාල 13 ක් සඳහා දේශනවලට අදාළ උපකරණ සඳහා රු.5,249,177 ක් වැය කර තිබුණි. තවද කවුඩුල්ල ජාතික උද්‍යානයේ දේශන උපකරණ නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පවතින බව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී පෙන්වා දී තිබුණි.

(ඇ) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඉදිකිරීම් කරනු ලබන, මී ඔය සිට කුඩා මැදවච්චිය දක්වා කි.මී.30 ක් දිගින් යුතු විදුලි වැටෙහි කි.මී. 19 ක් පමණ වැඩ අවසන් කර තිබුණත් ඉතිරි කොටසේ ඉදිකිරීම් කටයුතු අතර මඟ නතර කර තිබුණි.

(ඈ) මීගලෑව අඩවියේ කුඹුක් වැව, හඹරවත්ත, කඳුලුගමුව සිට කන්දේගම දක්වා ඉදිකරමින් පවතින කි.මී 50 ක පමණ වූ විදුලි වැට අතර මඟ නවතා දමා තිබුණි. මේ නිසා වැඩ අවසන් කර ඇති කොටසද, ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) හොරොව්පතාන විදුලි වැට ඉදි කිරීමේදී කි.මී.9 ක  සණ කැළය සහ කි.මී.7 ක මධ්‍යම ප්‍රමාණ කැළෑ කපා ඉවත් කිරීම පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු මඟින් ඉටු කර ගෙන තිබුණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ දැව සංස්ථාව ඒ සඳහා සහභාගි වී නොතිබුණු අතර ඉවත් කළ දැව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) කරුවලගස් වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කි.මී.113 හා වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කි.මී.66 ක විදුලි වැට නඩත්තු කටයුතු සිවිල් ආරක්ෂක නිලධාරීන් විසින් විධිමත් පරිදි නඩත්තු නොකෙරෙන බව නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම සඳහා ගොඩනැගිලි 27 ක් කුලී පදනම මත ලබා ගෙන තිබූ අතර ඉන් ගොඩනැගිලි 13 කට අදාළව බදු කුලී ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

**3.15** **මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 20 | 36 |
| (ii) | තෘතියික මට්ටම | 32 | 26 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 1,419 | 1,048 | 371 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 468 | 448 | 20 |
| | **එකතුව** | **1,975** | **1542** | **433** |